**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2017**

**---------------------------------------------------------------------------------------------------**

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ ගැලපීම් රු.476,644 ක් මුදල් ගලාඒම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුමේ ශේෂය අඩුවීම රු.15,000 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(iii) ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් ලෙස රු.172,628 ක අගයක් ඇතුළත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුලනයකර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.97,838,607 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රීය වී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙනආ පසුව වුවත්, ඊට පටහැනිව වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදී ගත් වර්ෂයටම ක්ෂය කිරීම හා ඉවත් කළ වර්ෂය වෙනුවෙන් ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී රාජ්‍ය ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු පිරිවැය රු.5,600,000 ක් වූ මෝටර් රථයක් 2016 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂයකර තිබුණු නමුත් වාර්ෂික ක්ෂය ප්‍රමාණයට වඩා අඩු අගයකින් රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කර තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම මෝටර් රථය වෙනුවෙන් රු.2,240,000 ක ශේෂයක් රාජ්‍ය ප්‍රදාන ගිණුමේ ඉතිරි වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.12,635,376 ක් වූ ස්ථාවර වත්කම්වල ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්ෂය ප්‍රමාණය පිළිවෙලින් රු.2,409,739 ක් හා රු.1,875,023 ක් වුවද ඊට සමාන අගයකින් පරිත්‍යාග ගිණුම ක්‍රමානුකූලව ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.886,467 ක් වූ උපචිත සේවක භාරකාර අරමුදල් දායකය, උපචිත වායුසමීකරණ අළුත්වැඩියා වියදම් හා පුහුණු වැඩසටහන් වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් නැවත කොන්ත්‍රාත් පදනම මත රෝහලේ සේවය කරනු ලබන නිලධාරීන් 6 දෙනෙකු සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට රු.262,031 ක පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ පරිගණක යන්ත්‍ර ක්ෂය රු.20,850 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වාට්ටු 4 ක හා ශලාගාරය තුළ පැවති රු.1,343,084 ක ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොග භෞතික පරීක්ෂණයට ලක්කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඉතිරි තොගය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භෞතික තොග සමීක්ෂණ වාර්තාවට අනුව තොගයේ පිරිවැය රු.16,579,101 ක් වුවද, තොග ලෙජරයට අනුව එම තොගයේ පිරිවැය රු.16,331,318 ක් වූයෙන් රු.247,783 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 702 (3) | එකතුව රු.2,317,856 ක් වූ මාසික කොන්ත්‍රාත් වටිනාකමක් සහිත, නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව, අමු ආහාර ද්‍රව්‍ය සපයාගැනීම, ආරක්ෂක සේවය, කිලිටි රෙදි සේදීම හා හෙද නේවාසිකාගාරය සඳහා නිවසක් බද්දට ගැනීම යන සේවාවන් වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත් ආයතන සමග එළඹි ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| (ආ) ඖෂධ කළමනාකරණ අත්පොත | |
| (i) 4 පරිච්ඡේදයේ 1 හා 2 ඡේද | ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය හා විකිරණශීලී ද්‍රව්‍ය සඳහා සමස්ත වාර්ෂික අවශ්‍යතාවය ඇස්තමේන්තු කර නොතිබුණි. |
| (ii) 5 පරිච්ඡේදයේ 2 ඡේදය | ඖෂධ සැපයීමේ ක්‍රියාවලියට ගතවන මුළු කාලය (Lead time) තීරණය කර නොතිබුණු අතර අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම්, යළි ඇණවුම් මට්ටම් හා ආරක්ෂිත තොග මට්ටම් පවත්වා නොතිබුණි. |
| (iii) 5 පරිච්ඡේදයේ 3 හා 4 ඡේද | කල් ඉකුත්වීම හෝ තත්ත්වයෙන් බාලවීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශය වෙත ආපසු යවන ඖෂධ පිළිබඳ කාර්තුමය වාර්තා පිළියෙලකර නොතිබුණි. |
| (iv) 10 පරිච්ඡේදයේ 13 ඡේදය | (i) භෞතික තොග සමීක්ෂණය විධිමත්ව සිදුකර නොතිබුණු බැවින් තොග අතිරික්තතා හා ඌනතා, සෙමින් චලනය වන, චලනය නොවන, කල් ඉකුත්වීමට ආසන්න හා කල් ඉකුත් වූ ද්‍රව්‍ය අනාවරණය කර ගෙන නොතිබුණි. නමුත් තොග පොත්වලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.1,011,606 ක් වූ සෙමින් චලනය වන ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 37 කට අයත් ඒකක 374,473 ක් හා පිරිවැය රු.528,047 ක් වූ චලනය නොවන ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 18 කට අයත් ඒකක 7,773 ක් විය. |

(ii) තොග පොත් අනුව, වාට්ටු 4 ක හා ශලාාගාරය තුළ 2017 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.1,343,004 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොග භෞතික සමීක්ෂණයට ලක් කර නොතිබුණි.

(iii) භෞතික තොග සමීක්ෂණ වාර්තා, සමීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කර නොතිබුණු අතර සමීක්ෂණය සිදුකළ අංශය භාර නිලධාරියාගේ නම, දිනය හා අත්සන යොදා සහතික කරවාගෙන නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

රෝහල් අධ්‍යක්ෂගේ අනුමැතියකින් තොරව මුළු පිරිවැය රු.283,310 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 10 ක් වෙනත් රජයේ රෝහල් 3 ක් වෙත ප්‍රධාන ඖෂධවේදී විසින් නිකුත්කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.14,269,158 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,091,146 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,360,304 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.23,762,457 කින් වැඩි වී තිබුණද රාජ්‍ය ප්‍රදාන රු.53,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.20,378,939 ක ඌනතාවයක් හා රු.3,558,018 ක අතිරික්තයක් වී තිබුණු අතර 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් රු.20,023,884 ක හා රු.3,091,146 ක ඌනතාවයක්ද 2017 වර්ෂයේදී රු.14,269,158 ක අතිරික්තයක්ද ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.68,464,933 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.177,372,828 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 4.1 කාර්යසාධනය

------------------

### 4.1.1 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, ආයතනයේ සංවිධාන සැලැස්ම, ආයතනයේ ශක්තිය, දුර්වලතා, බාහිර තර්ජන හා අවස්ථා පිළිබඳ විශ්ලේෂණය (SWOT Analyses), අරමුණුවලට ගැලපෙන පරිදි

අදාළ කාලසීමාව තුළ ළඟාවීමට අපේක්ෂිත ඉලක්ක හා ඒ සඳහා ක්‍රියාත්මක උපායමාර්ග 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඊට ඇතුළත්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රු.13,147,004 ක් වැයකර වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණු ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය සහ විකිරණ ද්‍රව්‍ය වර්ග 158 ක ඒකක 851,287 කින් එක් ඒකකයක් හෝ මිලදී ගෙන නොතිබීම හා මිලදී ගැනීමට ඇස්තමේන්තු නොකරන ලද ද්‍රව්‍ය වර්ග 125 කින් ඒකක 461,792 ක් මිලදී ගැනීම සඳහා රු.32,084,042 ක් වැයකර තිබීම යන කරුණු හේතුවෙන් අවශ්‍යතාව පිළිබඳ අවබෝධයකින් හෝ අධ්‍යයනයකින් තොරව අදාළ ඇස්තමේන්තුව පිළියෙලකර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.39,699,740 ක් වුවද එය සියයට 58 කින් ඉක්මවා තිබුණු අතර වැයකර තිබුණු තථ්‍ය වියදම රු.62,654,007 ක් විය.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාරලත් රෝගීන්, සායන සඳහා පැමිණි රෝගීන් හා නේවාසික රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 11 කින්, සියයට 14 කින් හා සියයට 48 කින් අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු අක්ෂි ශල්‍යකර්ම හා සුළු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව පිළිවෙලින් සියයට 81.72 කින් හා සියයට 33.46 කින් අඩු වී තිබුණි. එසේම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු ලේසර් පරීක්ෂණ සංඛ්‍යාව, X-ray පරීක්ෂණ සංඛ්‍යාව හා Refraction Service පිළිවෙලින් සියයට 50 කින්, සියයට 49 කින් හා සියයට 41 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී කායික විශේෂඥ වෛද්‍යවරයා හා අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයා සේවයෙන් ඉවත්ව තිබුණු නමුත් එම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 35 ක් වූ කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් වැඩි කිරීමේ ව්‍යාපෘතිය මගින්, වෛද්‍ය සායන, දන්ත සායන හා බාහිර රෝගී රසායනාගාරය සඳහා ඉඩ පහසුකම් වැඩි කිරීම මෙන්ම බාහිර අංශයේ රෝගීන්ට වාතාශ්‍රය සහිත රැඳී සිටීමේ පහසුකම් ඇති කිරීමට සැලසුම්කර තිබුණද නිසි සැලසුමකට අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ප්‍රමාණවත් නොවීම නිසා 2018 මැයි 31 වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු සංයුක්ත සැලැස්ම ප්‍රකාරව, රු.24,700,000 ක් වටිනා වෛද්‍ය උපකරණ 4 ක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර හෝ නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, රු.4,000,000 ක් වැයකර ශල්‍යාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා ප්‍රමාණ පත්‍ර හා ඇස්තමේන්තු පිළියෙල කිරීම පමණක් සිදුකර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

රෝහල් මණ්ඩලයේ අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව පහත සඳහන් යන්ත්‍ර මිලදී ගැනීම හේතුවෙන් ඒවා ඌන උපයෝජිතව පැවතුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී රු.2,500,000 ක් වැය කර, පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක අධි ධාරිතාවයක් සහිත Fully Automated Hematology Analyzer යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂවලදී පිළිවෙලින් පැයකට පරීක්ෂණ ඒකක 17 ක්, පැයකට පරීක්ෂණ ඒකක 9 ක් හා පැයකට පරීක්ෂණ ඒකක 20 ක් පමණක් සිදුකර තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.8,736,000 ක් වැයකර පරීක්ෂණ වර්ග 21 ක් හා පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 300 ක් සිදුකළ හැකි අධි ධාරිතාවයක් සහිත Fully Automated Biochemistry Analyzer යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වර්ග 12 ක් පමණක් සිදුකර තිබුණු අතර පිළිවෙලින් පැයකට පරීක්ෂණ ඒකක 25 ක් හා පරීක්ෂණ ඒකක 34 ක් පමණක් සිදුකර තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි සේවකයින් 55 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් නියමිත කාලය තුළදී ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාළව එම අරමුදල් වෙත දායක මුදල් ලෙස රු.1,533,879 ක්ද, අධිභාර ලෙස රු.2,204,066 ක්ද වශයෙන් මුලු මුදල රු.3,737,945 ක් රෝහල් මණ්ඩලයට ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) X - Ray Films පවතින තොගය හා පාරිභෝජනය වන ප්‍රමාණය නිවැරදිව හඳුනා නොගෙන අවශ්‍යතාවය ඉක්මවා මිලදීගෙන තිබීම හේතුවෙන් 2018 මාර්තු 01 දින වන විට පිරිවැය රු.330,426 ක් වූ X - Ray Films 5,006 ක් කල් ඉකුත්වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ 13 ඡේදය ප්‍රකාරව, සේවාව උසස් තත්ත්වයෙන් සිදුකළ බවට ඒ ඒ අංශ හා වාට්ටු භාර නිලධාරීන්ගෙන් සහතිකයක් ලබා ගත යුතු වුවද එසේ ලබා නොගෙන සමාලෝචිත වර්ෂයට අදාළව පිරිසිදු කිරීමේ සේවාව වෙනුවෙන් රු.2,812,680 ක් ගෙවා තිබුණි.

(ආ) රෝහලට අමු ආහාර සපයා ගැනීම හා රෝගීන්ට ආහාර ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු 2015 මැයි 28 දිනැති හා අංක 01 - 21/2015 දරන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යථෝක්ත චක්‍රලේඛයේ 5.1.3 හා 5.1.4 ඡේද ප්‍රකාරව, සති ආහාර වැඩසටහන පිළියෙල කිරීමට ආයතන ප්‍රධානියා විසින් ආහාර කළමනාකරණ කමිටුවේ සහාය ලබාගැනීම, පිළියෙල කරනු ලබන සති ආහාර වැඩසටහන අදාළ අංශ වෙත ලබාදීම හා එළවළු සැපයීමේ මාසික වැඩසටහනක් පිළියෙල කිරීම සිදුකර නොතිබුණි.

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 7.5 හා 7.7 ඡේද ප්‍රකාරව, උදෑසන වාට්ටුවලට යන වෛද්‍ය නිලධාරීන් විසින් සෑම රෝගියෙකුටම යෝග්‍ය ආහාර වටයක් ඇඳ ඉහපතෙහි සටහන් කිරීම හා අමතර ආහාර පිළිබඳ අවශ්‍යතාවය අනුව ඇඳ ඉහපතෙහි සටහන්කර එය පෞද්ගලිකවම සහතික කිරීමට කටයුතුකර නොතිබුණි.

(iii) යථෝක්ත චක්‍රලේඛයේ 8.1.1, 8.1.3 හා 8.1.4 ඡේද ප්‍රකාරව, සෑම මාසයකම පළමුවනදා නේවාසික රෝගීන් වෙනුවෙන් සෞඛ්‍ය 31 ආකෘති පත්‍රයට අනුව වාට්ටුව සඳහා වෙනම අළුත් ආහාර වට පත්‍රිකාවක් පිළියෙල කිරීමට, අදාළ නිලධාරීන් විසින් ඇඳ ඉහපත් පරීක්ෂාකර ආහාර වට පත්‍රිකාවේ නියමිත ආහාරය සටහන් කිරීමට, එක් එක් රෝගීන්ගේ ආහාර වට සාරාංශකර දවසට අවශ්‍ය ආහාර වට ප්‍රමාණය ගණනය කිරීමට හා එහි සිටින රෝගීන් සංඛ්‍යාව සමඟ සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(iv) යථෝක්ත චක්‍රලේඛයේ 10.5, 10.10 හා 11.7 ඡේද ප්‍රකාරව, පිසූ ආහාර ඉතිරිව අපතේ යාම පිළිබඳ පරීක්ෂාකර ඒ අනුව අමු ආහාර යම් ප්‍රතිශතයක් අඩුකර ඇණවුම් කිරීමට, ප්‍රසම්පාදන කමිටුව අනුමතකර ඇති මාසික උපරිම සැපයුම් සීමාව තුළ ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීමට හා ඒ සම්බන්ධ විධිමත් පාලනයක් පවත්වා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(v) යථෝක්ත චක්‍රලේඛයේ 14.1, 15.1 හා 15.3 ඡේද ප්‍රකාරව, පිසින ලද ආහාර ද්‍රව්‍ය බෙදීමට පෙර නිදර්ශන පෙන්වීමට, රෝහල් සේවකයින් ආහාර කාඩ්පත් අනුව ආහාර ලබාගන්නා බව පරීක්ෂාකාරීවීමට හා නියමිත ආහාර ප්‍රමාණය පමණක් සේවකයන්ට ලබාදෙන බව තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) යථෝක්ත චක්‍රලේඛයේ 17 උපලේඛනය ප්‍රකාරව, රජයට අවම පිරිවැයක් වැය වන ආකාරයට අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ලබාගැනීම, පිසීම හා බෙදාහැරීම පිළිබඳ කළමනාකරණය සඳහා ආහාර කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා ශල්‍යාගාරය අළුත්වැඩියා යන ප්‍රාග්ධන වියදම් සඳහා රු.18,300,000 ක් රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබී තිබුණු නමුත්, එම කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණු බැවින් ඉන් රු.15,000,000 කට අධික මුදලක් ඉතිරි වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වියදම් සඳහා වූ මුදල් පොතට අනුව ඉතිරිවී තිබුණු මුළු රාජ්‍ය ප්‍රදාන ශේෂය රු.28,361,382 ක් විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය 250 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 210 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3.1 ඡේදය ප්‍රකාරව ආරෝග්‍යශාලා මණ්ඩලය සඳහා අනුමත කිසිදු තනතුරක් වෙනුවෙන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පිළියෙල කර නොතිබුණි.

(ආ) අනුමත ලියාපදිංචි වෛද්‍ය නිලධාරි තනතුරු සංඛ්‍යාව 02 ක් හා තථ්‍ය සංඛ්‍යාව 03 ක් වුවද අතිරික්ත තනතුර සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) රෝහලේ ප්‍රධාන තනතුරු 7 ක් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 මාර්තු 14 දින අනුමතකර තිබුණද එම තනතුරුවල පවතින පුරප්පාඩු 21 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---------------------------

**5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම**

------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------------

**6.1 විගණන කමිටු**

---------------------

2010 දෙසැම්බර් 14 දිනැති හා අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-----------------------------------------------

**6.2.1 ප්‍රසම්පාදනයන්**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.27,952,476 ක් වූ නඩත්තු හා පිරිසිදු කිරීමේ සේවාව, අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම, ආරක්ෂක සේවය, කිලිටි රෙදි සේදීම හා හෙද නේවාසිකාගාරය සඳහා නිවසක් බද්දට ගැනීම යන සේවාවන් ලබාගෙන තිබුණු අතර, එම සේවාවන් ලබාගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයන් වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) හා (ඇ) ඡේදය, 2.11.3 ඡේදය, 2.12 (අ) ඡේදය, 3.12.2 (i), (ii) හා (iii) ඡේද, 5.3.1 (අ) (ඇ) දක්වා වූ ඡේද, 5.3.2 ඡේදය හා 6.3.6 ඡේදය ප්‍රකාරව, පිළිවෙලින්

(i) ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාව හා ඒවා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම මෙන්ම පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සැකසීම හා ඒවා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නිශ්චිත ආකෘතියට අනුව වාර්තාගත කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් රහස්‍යභාවය හා අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රකාශයක් ලබාදී නොතිබුණි.

(iv) පූර්ව සුදුසුකම් පරීක්ෂාවේ උපමාන නිශ්චිතව හඳුනාගැනීම සහ සාර්ථකව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට ලංසුකරුවන් වෙත ඇති හැකියාව තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලංසු ආරාධනාවේ ඇතුළත්කර නොතිබුණි.

(v) රෝහල් මණ්ඩලය විසින් සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශයක් භාවිතාකර නොතිබුණු අතර සම්මත ලංසු කැඳවීමේ ලේඛන වෙනුවට භාවිතා කරනු ලබන ලංසු ලේඛනවල යෝග්‍යතාවය පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පරීක්ෂාකර අනුමතකර නොතිබුණි.

(vi) ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු ඍජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන හා සුදුසුකම් ඇතුළත්ව ලංසු ආරාධනාව පිළියෙලකර නොතිබුණි.

(vii) ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතියට අනුව වාර්තාකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රෝහලේ අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමේ වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකම එකතුකළ අගය මත බදු රහිතව රු.15,553,860 ක් වූ නමුත් සත්‍ය වාර්ෂික වියදම රු.3,848,913 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මාසික අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවය ප්‍රමාණය ඉක්මවා ඇස්තමේන්තු කර ලංසු කැඳවා තිබීම හේතුවෙන් වැඩි ලංසුකරුවන් සංඛ්‍යාවකගෙන් ලංසු ලබාගත හැකිවීමේ අවස්ථාව මඟහැරී තිබුණු අතර රෝහලේ වාර්ෂික සත්‍ය අවශ්‍යතාවයට වඩා සියයට 75 කින් වැඩි අගයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) ලංසු ඇගයීමේදී ආහාර ද්‍රව්‍යවල වෙළඳපල මිල දර්ශකය අනුව සම්මත මිල පදනම් කරගෙන ඇගයීම් කර තිබුණද ඇතැම් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා, තෝරාගත් ලංසුකරුගේ මිල ගණන් සම්මත මිල ඉක්මවා තිබුණු නමුත් ඒ පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි. වියළි ආහාර ද්‍රව්‍ය 10 ක් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී, මිල ඉක්මවීම සම්මත මිලට සාපේක්ෂව සියයට 14 සිට සියයට 53 දක්වා පරාසයක පැවතුණි.

## 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------------

කොන්ත්‍රාත් වටිනාකම රු.12,431,157 ක් වූ රෝහලේ රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ විධිමත් දින දීර්ඝ කිරීම් සහිත කොන්ත්‍රාත් කාලය දින 300 ක් වුවද, දින 412 ක කාලයක් ගතකර තිබුණි. ඒ අනුව ප්‍රමාද දින 112 ක් සඳහා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව දිනකට රු.6,000 බැගින් රු.672,000 ක ප්‍රමාද ගාස්තු අය කර ගත යුතු වුවද, එසේ ප්‍රමාද ගාස්තු අයකිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුගේ බිල්පත් සඳහා සියයට දහයක රඳවාගැනීම් හැර සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

## 6.3 අයවැය පාලනය

-----------------

විෂයයන් 15 කට අදාළ අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 51 සිට සියයට 141 දක්වා විචලනයන් පැවතීම හා වැය විෂයයන් 4 ක් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමෙන් තොරව රු.609,325 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබීම ආදී වූ හේතූන් මත අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පාලනය | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකරවා ගත හැකි වන ලෙස මනා අධීක්ෂණයක් සිදුකර නොතිබීම, උපරිම කාර්ය සාධනයක් ලබා ගැනීමට කටයුතුකර නොතිබීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයකර නොතිබීම. |
| (ආ) ඖෂධ තොග ගබඩා පාලනය | තොග අවශ්‍යතාවය හඳුනාගැනීමේ සිට තොග ලැබීම් හා නිකුත් කිරීම් ලේඛනගත කිරීම සහ ගිණුම්ගත කිරීම දක්වා ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට කටයුතුකර නොතිබීම හා භෞතික තොග සමීක්ෂණ කටයුතු විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ඇ) ගිණුම්කරණය | ඖෂධ තොග පාලන ගිණුම් පවත්වා නොතිබීම හා ජර්නල් සටහන් භාවිතයෙන් තොරව ගැලපීම් සිදු කිරීම. |